&ih, u ysl u wejrK
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

11 ශ්‍රේණිය

# කතෝලික ධර්මය

කාලය පැය 3 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ''දරුවෙනි, ඔබේ දෙමාපියන්ට කීකරු වන්න. එය ක්‍රිස්තියානි යුතුකමකි.'' එපීස ලිපියේ සඳහන් මෙම ප්‍රකාශයේ ඉතිරි කොටස වන්නේ,
(1) ඔබේ පියාටත්, මවටත් ගෞරව කරන්න.
(2) ඔබේ දෙවිඳුන්ට ගෞරව කරන්න.
(3) ඔබගේ යුතුකම් නොපිරිහෙලා ඉටුකරන්න.
(4) ඔබේ සහෝදර සහෝදරියන් අමතක නොකරන්න.

02 පූජාප්‍රසාදිවරුන් බෙදෙන ප්‍රධාන කණ්ඩායම් දෙක වන්නේ,
(1) සාමාන්‍ය පූජක හා පැවිදි පූජක (2) පදවි පූජක හා නිල පූජක
(3) පැවිදි පූජක හා පදවි පූජක (4) නිළ පූජක හා සාමාන්‍ය පූජක

03 නව ආදම් යනු
(1) මෝසෙස් තුමාය (2) ස්නාවක ජොහාන් තුමාය
(3) ජේසුස් වහන්සේය (4) ආබ්‍රහම් තුමාය

04 මුල් කිතුණු සභාවේ පූප කැඩීමේ මෙහෙය වත්මන් සමාජය තුළ නිරූපණය වන්නේ,
(1) දිව්‍ය පූජාව තුළින් ය. (2) දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය තුළින් ය.
(3) ශුද්ධ වූ පැය තුළින් ය. (4) කිතුණු ඒකක රැස්වීම් තුළින් ය.

05 ශුද්ධ වූ බයිබලය තුළ දස පනත ගැන සඳහන් ග්‍රන්ථ දෙක වන්නේ,
(1) උත්පත්ති පොත සහ නික්මයාම (2) ද්විතීය නීති සංග්‍රහය සහ ගණන් කථාව
(3) නික්මයාම සහ ද්විතීය නීති සංග්‍රහය (4) නික්මයාම සහ යෙසායා ග්‍රන්ථය

06 පව්කාර අපට දෙවියන්වහන්සේ හා ඒකාබද්ධ වීමට හැකියාව ලැබුනේ,
(1) ජේසුස් වහන්සේ මෙලොවට පැමිණීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(2) ජේසුස් වහන්සේ ජනතාවට කළ ධර්ම දේශනාවල ප්‍රතිඵලයක් වශයෙනි.
(3) දෙවියන්වහන්සේ තම පුත්‍රයාව අප වෙත එවීමට දුන් පොරොන්දුවේ ප්‍රතිඵලයක් වශයෙනි.
(4) ජේසුස් වහන්සේ පාස්කු අභිරහසේ ප්‍රතිඵලයක් වශයෙනි.

07 ''ආලෝකයේ අභිරහස්'' ශුද්ධ වූ සභාවට හඳුන්වා දෙන ලද්දේ,
(1) දසවන පියුස් පාප් වහන්සේ (2) 2 වන ජුවාම් පාවුළු පාප් වහන්සේ
(3) 6 වන පාවුළු පාප් වහන්සේ (4) 16 වන බෙනඩික් පාප් වහන්සේ

08 ආශිර්වාදකාර බන්ධනය ප්‍රසාද නිධානය දානය කරනු ලබන්නේ,
(1) පූජාප්‍රසාදි තුමා විසින් විවාහ වන දෙදෙනාට ය.
(2) රදගුරු තුමා විසින් විවාහ වන දෙදෙනාට ය.
(3) විවාහ වන දෙදෙනා විසින් එකිනෙකාට ය
(4) විවාහ වන පුරුෂයා විසින් භාර්යාවට ය.

09 අභිවෘද්ධි ආලේපයේ වැදගත්ම සිද්ධිය වන්නේ,
(1) නළලේ කුරුසිය ලකුණු කිරීම.
(2) හිස මත අත තබා ශුද්ධ වූ තෛලයෙන් ආලේප කිරීම.
(3) දිව්‍ය සත්ප්‍රසාදය දානය කිරීම.
(4) හිස මතට ජලය වත්කර යාච්ඤා කිරීම.

10 ස්වභාවික නීතිය යනු,
(1) මෝසෙස්ගේ නීතියයි. (2) හෘද සාක්ෂියයි.
(3) ශුද්ධ වූ සභා නීතියයි. (4) තමන්ම ඇතිකරගන්නා නීතියයි.

11 ප්‍රසාද නිධානයන්ගෙන් ප්‍රසාද නිධානය යන නමින් අද්විතීය ස්ථානයක් ගන්නා ප්‍රසාද නිධානය වන්නේ,
(1) දිව්‍ය සත්ප්‍රසාදය (2) ප්‍රසාද ස්නාපනය
(3) පූජකවරය (4) අභිවෘද්ධි ආලේපය

12 නිල පූජකවරය ස්ථාපිත කරන ලද්දේ,

(1) මහ සිකුරාදා දිනයේ දී (2) අන්තිම රාත්‍රී භෝජනයේ දී

(3) පාස්කු ඉරුදිනයේ දී (4) ගොබ් ඉරුදිනයේ දී

13 ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපනයෙන් ලැබූ දේව ජීවිතය පෝෂණය වන්නේ ..................................... තුළිනි. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

(1) දිව්‍ය සත්ප්‍රසාදය (2) සමඟි සන්ධානය

(3) පූජකවරය (4) ආශිර්වාදකාර බන්ධනය

14 සැබෑ කිතුණුවකු ලෙස සමාජය තුළ සාක්ෂි දැරීමට නම්

(1) ශුද්ධ වූ ලියවිල්ල ගැන මනා දැනුමක් ලබා තිබිය යුතුය.

(2) ආහාරයට ගන්නා පැණි මෙන් රසවත් විය යුතුය.

(3) අධ්‍යාපනික දැනුම අතින් පොහොසත් විය යුතුය.

(4) පොළොවේ ලුණු මෙන් රසවත් විය යුතුය.

15 මිනිසා සුවිශේෂී භාවයකින් යුක්ත වන්නේ,

(1) මැවිල්ලේ පාලනය හිමිව ඇති නිසාය.

(2) සියලු සතුන්ට වඩා ප්‍රඥාවන්ත නිසාය.

(3) දෙවියන් වහන්සේ විසින් මවනු ලැබූ නිසාය.

(4) ආත්මයක් සහ ශරීරයක් ඇති නිසාය.

16 දෙවියන්වහන්සේගේ ආදරයේ සැලැස්ම අනාවරණය කළේ,

(1) ශුද්ධ වූ සභාව තුළිනි. (2) අපගේ පවුල තුළිනි.

(3) අන්තර්ජාලය තුළිනි. (4) මැවිල්ල තුළිනි.

17 ක්‍රිස්තු ඉගැන්වීම අනුව ඔබට පීඩා කරන අය වෙනුවෙන් ඔබගේ ප්‍රතිචාරය විය යුත්තේ,

(1) ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීමයි. (2) ඔවුන්ගෙන් ඈත්වීමයි.

(3) ඔවුන්ට ශාප නොකර ආශිර්වාද කිරීමයි. (4) ඔවුන් ගැන නිතර විමසිලිමත් වීමයි.

18 ''දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක.'' මෙහි දැක්වෙන ආලේප කළ තැනැත්තා වූයේ,

(1) දාවිත් රජතුමා ය. (2) ජේසුස් වහන්සේ ය.

(3) යෙසායා දිවැසිවරයා ය. (4) ස්නාවක ජුවාම්තුමා ය.

19 තුන්කාලයේ ආරාධනය උච්චාරණය කිරීමෙන් අප සිහිකරන්නේ,

(1) ගාබ්‍රියෙල් දේවදූතයා මරියාවන්ට කී මංගල පුවතයි.

(2) ජේසුස් වහන්සේගේ මාංශගතවීමේ පුවතයි.

(3) දේව මාතාවන් දාසියක් වෙමින් දේව කැමැත්ත ඉටුකළ පුවතයි.

(4) මරියාවන් එලිසබෙත් තුමිය බැහැදැකීමට ගිය පුවතයි.

20 අපට දේව මහිමය අත්දැකිය හැකි වන්නේ,

(1) උසස් අධ්‍යාපනය හා අත්දැකීම් තුළින්

(2) දේව ප්‍රසාද නිධාන ලැබීම හා යාච්ඤාව තුළින්

(3) දේව උපකාරය හා දේව වරප්‍රසාද තුළින්

(4) සභාව තුළ කරන සේවාව හා පුද්ගල ඇසුර තුළින්

21 මව්කුස තුළදීම ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ දිවැසිවරයා වන්නේ,

(1) ජෙරමියා (2) ආමෝස් (3) ස්නාවක ජොහාන් (4) එසකියෙල්

22 අපෝස්තුළුවරුන් වෙත ශුද්ධාත්මයාණන් වැඩම කළේ

(1) පෙන්තකොස්ත දිනයේ දී (2) පාස්කු මංගල්‍යය දිනයේ දී

(3) ස්වර්ගාරෝහණ දිනයේ දී (4) ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය දිනයේ දී

23 විසිරී ගිය මිනිසා එක්කරන්නට දෙවියන්වහන්සේ විසින් කැඳවූයේ,

(1) මෝසෙස් තුමාය (2) ස්නාවක ජුවාම් තුමාය

(3) දාවිත් රජතුමා ය (4) ආබ්‍රහම් තුමාය

24 මිනිස්කමට ගරුකිරීමට නම් .............................. අනුව ජීවත් විය යුතුය. හිස්තැනට සුදුසු යෙදුම වනුයේ,

(1) දේව දීමනාවලට (2) දේව ප්‍රේමයට

(3) හෘදය සාක්ෂියට (4) දේව පනත්වලට

25 නූතන ලෝකය තුළ අප ක්‍රියාකාරී විය යුත්තේ,

(1) ශ්‍රේෂ්ඨයන් වීමට ය. (2) හොඳ නම ආරක්ෂා කර ගැනීමටය.

(3) ධනය හා බලය උපයාගැනීමටය. (4) ස්වාමීන් වහන්සේට සාක්ෂි දැරීමට ය.

26 වසර 20 පුරා මීසමේ මරිය හමුදාවේ ප්‍රබල සාමාජිකාවක් වූ මාග්‍රට් නැන්දාට මීසමේ පියතුමා ඉරිදා දින දිව්‍ය පූජාවෙන් පසු විශේෂ උපහාරයක් දක්වන ලදී. පියතුමා එම උපහාරය තුළින් සිදුකළේ,

(1) ගිහි ධර්මදූත සේවය ඇගයීමය.
(2) මරිය හමුදා සේවය ගැන ජනතාව දැනුවත් කිරීමය.
(3) දේව කැඳවීම්වලට දරුවන් පෙළඹවීමය.
(4) මරිය හටයින් වැඩිකර ගැනීමට උත්සාහ කිරීමය.

27 ජේසුස් වහන්සේගේ ධර්මදූත කාර්යයයේ උච්චතම අවස්ථාව වනුයේ,

(1) පන්දහසකට කෑම දීමය.
(2) දේව මාලිගාවේ පඬිවරුන් මැද දේශනා කිරීමය.
(3) ගෝලයින් තෝරාගැනීමය.
(4) දුක්විඳීම, මරණය හා උත්ථානයයි.

28 දේව අනාවරණයේ අරමුණ වනුයේ,

(1) ක්‍රිස්තුන් වහන්සේ මගින් දෙවියන් වහන්සේ හමුවීමය.
(2) දෙවියන් වහන්සේට වන්දනා කළ යුතු බව ඉගැන්වීමය.
(3) දෙවියන්වහන්සේගේ වැඩසිටීම ප්‍රකාශ කිරීමය.
(4) ශුද්ධ ලියවිල්ල කියවීමට පෙළඹවීමය.

29 ඔබ පැවිදි හෝ පූජක හෝ ජීවිතය සඳහා කැඳවීමක් ඇතැයි සිතන්නේ නම් ඔබ කළයුතු ප්‍රධානම කාර්යය වන්නේ,

(1) මීසම භාර පූජා ප්‍රසාදි තුමා හමුවී ඒ බව පැවසීමය.
(2) දෙමාපියන් සමග ඒ ගැන සාකච්ඡා කිරීමය.
(3) එම කැඳවීම හා සම්බන්ධ නිකායන් ගැන සොයාබැලීමය.
(4) දේව කැමැත්ත තෝරාගැනීම සඳහා යාච්ඤා කිරීමය.

30 පවතින ලෝකය තුළ මිනිසාගේ කාර්ය භාරය විය යුත්තේ,

(1) ජීවිතයට අදාළ නිපැයුම් පමණක් තෝරාගැනීමය.
(2) ස්වභාව ධර්මයේ සිදුවන වෙනස්කම් පිළිබඳ විමසිලිමත් වීමය.
(3) නව නිපැයුම් මගින් මැවිල්ල ශුද්ධවන්තව ඉදිරියට ගෙනයාමය.
(4) නව තාක්ෂණය අන් අයට බාධාවක් නොවන ලෙස යොදාගැනීමය.

31 පැරණි ගිවිසුම තුළ දේව අනාවරණයෙහි වැදගත් කාර්යභාරයක් ඉටුකළ දෙපිරිස වන්නේ,

(1) ආදිපිතෘවරුන් හා දිවැසිවරුන්ය (2) රජවරුන් හා පූජකවරුන්ය
(3) දිවැසිවරුන් හා රජවරුන්ය (4) විනිශ්චයකරුවන් හා ආදි පිතෘවරුන්ය

32 අප කරන වරදට සමාව ලැබෙන්නේ,

(1) අප මින් පසු වැරදි නොකරන තරමටය.
(2) අපට වරද කරන අයට අප සමාව දෙන ආකාරයටය.
(3) අපගේ වැරදි ගැන මනස්ථාපනය වූ විටය.
(4) දෙවියන් වහන්සේගෙන් සමාව ඉල්ලූ විටය.

33 ගැඹුරු දේව සම්බන්ධතාවයක් ඇතිකර ගත හැකි මාර්ගයකි,

(1) ගීතිකා ගායනය (2) පෞද්ගලික යාච්ඤාව
(3) ධ්‍යානයට සමවැදීම (4) ශුද්ධ ලියවිල්ල කියවීම

34 නව ගිවිසුමේ උත්තම පූජකයා වන්නේ,

(1) අන්නාස් (2) ජේසුස් වහන්සේ
(3) කායාපස් (4) ස්නාවක ජොහාන් තුමා

35 තම ජීවිතයේ පාරිශුද්ධභාවය වෙනුවෙන් ජීවිතය පූජා කළ සාන්තුවරියන් දෙදෙනෙකු වන්නේ,

(1) ශුද්ධ වූ හෙලේනා තුමිය හා ශුද්ධ වූ මරියා ගොරෙත්ති තුමිය
(2) ශුද්ධ වූ මොනිකා තුමිය හා ශුද්ධ වූ මරියා ගොරෙත්ති තුමිය
(3) ශුද්ධ වූ මරියා ගොරෙත්ති තුමිය හා කල්කටාවේ තෙරේසා තුමිය
(4) ශුද්ධ වූ ඇග්නස් තුමිය හා ශුද්ධ වූ මරියා ගොරෙත්ති තුමිය

36 පැවිදි වේදභාර වනුයේ,

(1) දිළිඳුකම, ව්‍රත ශුද්ධිය හා කීකරුකම (2) දිළිඳුකම, කීකරුකම හා බැහැපත්කම
(3) බඹසර රැකීම, කීකරුකම හා නිර්භීතකම (4) නිර්භීතකම, කීකරුකම හා බැහැපත්කම

37 දිව්‍ය පූජාවට සහභාගි වීම තුළින්

(1) මීසම් පවුලේ සාමූහික යාගයට එක්වේ. (2) දේව ප්‍රශංසාවට මග පෑදේ.
(3) ජේසු සමිඳුන්ගේ කුරුසියේ යාගයට එක්වේ. (4) දේව වචනයට සවන්දීමට අවකාශ ලැබේ.

38 ප්‍රශංසාව හා ඉල්ලීම අන්තර්ගත වී ඇති යාච්ඤාව නම්

(1) උත්තම පූජක යාච්ඤාවයි. (2) ස්වාමිවාක් ආරාධනයයි.

(3) යාම යැදුමයි. (4) තුන්කාල ආරාධනාවයි

39 ''ඔබ යාච්ඤා කරන කල ඔබේම ඇතුළු කාමරයට වැද දොර වසාගෙන ......................... ඔබේ පියාණන්ට යාච්ඤා කරන්න.'' හිස්තැනට යෝග්‍ය වචනය වනුයේ,

(1) භාවනාශීලීව (2) හුදකලාව (3) සුපරීක්ෂාකාරීව (4) රහසිගතව

40 කිතුණු දිවි මග සාර්ථක කර ගැනීම සඳහා අපට ලැබෙන පිටිවහලක් නම්,

(1) ශුද්ධාත්ම දීමනාය (2) ආධ්‍යාත්මික දීමනාය

(3) ආත්මික පුණ්‍ය ක්‍රියාය (4) ශුද්ධාත්ම ඵලයන් ය

## II - කොටස

● පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. ඉතිරි ප්‍රශ්නවලින් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.

01 (1) දේව රාජ්‍යයේ පදනම් 3 නම් කරන්න.

(2) ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු මණ්ඩලය විසින් අනුමත කර ඇති ණය මංගල්‍යය 2 ක් නම් කරන්න.

(3) පොදු පූජකවරය තුළින් කැඳවීම් 2 ක් ලියන්න.

(4) ජන වන්දනාවේ ප්‍රධාන කොටස් 2 නම් කරන්න.

(5) ඉරුදින ස්වාමින්වහන්සේගේ දිනය ලෙස නම් කිරීමට හේතු වූ කරුණු 2 ක් ලියන්න.

(6) උත්පත්ති පොතේ පළමු පරිච්ඡේදයේ සඳහන් ආකාරයට දෙවියන්වහන්සේ මිනිසාට අණ කළේ කුමක් ද?

(7) ඇදහිල්ල වර්ධනය කරගැනීම සඳහා කළයුතු කාර්යයන් දෙකක් ලියන්න.

(8) කිතුණුවාට මෙලොව අයත්වන ජීවිත තත්ත්ව දෙකක් ලියන්න.

(9) බිඳවැටුණු ශක්තිය ගොඩනැගීමට දිරිදෙන ප්‍රසාද නිධාන 2 ක් නම් කරන්න.

(10) ආබ්‍රහම් සමග කළ ගිවිසුමෙන් දෙවියන් වහන්සේ කුමක් අනාවරණය කළේද?

02 (1) පළමු පණතට විරුද්ධව අප අතින් සිදුවන පාපයන් 2 ක් ලියන්න.

(2) දෙවියන් වහන්සේ වෙනුවෙන් ඔබ සබත් දිනය ශුද්ධ ලෙස ගතකරන ආකාර 3 ක් ලියන්න.

(3) දේව විශ්වාසයට පටහැනිව ක්‍රියා කරන ඔබේ මිතුරකු හට නැවත විශ්වාසය ගොඩනගාගැනීමට ඔබට ගතහැකි පියවර 5 ක් ලියන්න.

03 (1) අභිවෘද්ධි ආලේපය එක්වරක් පමණක් ලබාගන්නේ ඇයි?

(2) අභිවෘද්ධි ආලේපය ලැබීමට අවශ්‍ය සුදුසුකම් 3 ක් ලියන්න.

(3) ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දැරීම සඳහා අභිවෘද්ධි ආලේපය ලබාසිටින ඔබට කළහැකි යහපත් ක්‍රියා 5 ක් ලියන්න.

04 (1) ''කිතුණු විවාහය හුදු සමාජ චාරිත්‍රයක් පමණක් නොව දේව ප්‍රසාද නිධානයකි.'' මෙය පහදන්න.

(2) පොදු සමාජය යහමගට ගෙනඒම සඳහා කිතුණු පවුලෙන් ලැබිය යුතු ආදර්ශයන් තුනක් ලියන්න.

(3) මිනිස් පවුල ත්‍රිත්වික ප්‍රේමය ලොවට පෙන්වන කැඩපතකි. මෙය කරුණු 5 කින් පැහැදිලි කරන්න.

05 (1) අප අධ්‍යාත්මිකව වර්ධනය වීමට අනුගමනය කළයුතු ක්‍රියාකාරීත්වයන් දෙකක් පෙළි 5 කින් ලියන්න.

(2) ආදර්ශමත් ක්‍රිස්තු ශ්‍රාවකයකු වීමට අවශ්‍ය කරුණු 3 ක් ලියන්න.

(3) තරුණ ඔබගේ ජීවිතය තුළ ඉවත් කළ යුතු පැවතුම් හා ඔබගේ ජීවිතයට එක්කරගතයුතු පැවතුම් 3 බැගින් ලියන්න.

06 (1) සියලුම මැවිලිවලට වඩා මනුෂ්‍යයා උතුම් බව උත්පත්ති පොතේ කතුවරයා පැහැදිලි කරන කරුණු දෙකක් ලියන්න.

(2) මැවිල්ලේ භාරකාරත්වය ලැබූ මිනිසාට භෞතික සම්පත් කෙරෙහි පැවරෙන වගකීම් තුනක් සඳහන් කරන්න.

(3) ''අපගේ ශරීර දේව මාලිගයන්ය.'' මේ සංකල්පය තහවුරු කිරීමට හේතු පහක් ඉදිරිපත් කරන්න.

07 පහත සඳහන් මාතෘකා තුනක් තෝරාගෙන එකකට පේළි 12 කට නොඅඩු වන සේ කෙටි සටහන් ලියන්න.

(1) ජුසේවාස් පියතුමා

(2) භාග්‍යවත් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා

(3) භාග්‍යවත් තෙරේසා මව්තුමිය

(4) මුල් කිතුණු සභාවේ ජීවිත පැවැත්ම

(5) පෙරමග සරසන්නාවූ ස්නාවක ජුවාම් තුමා